| ප්‍රශ්න සංඛ්‍යාව | 6 |
|---|---|
| පිටු සංඛ්‍යාව | 6 |

100

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2011 - විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය - I කොටස පරීක්ෂණය

## 2014 මැයි

## BME 1505- කළමනාකරුවන් සඳහා ගිණුම්කරණය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**කාලය පැය: 03**

---

### I කොටස

**ප්‍රශ්න අංක 01**

I. පහත සඳහන් සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.
- i. ව්‍යාපාර ඒකක සංකල්පය
- ii. අඛණ්ඩ පැවැත්මේ සංකල්පය
- iii. කාලච්ඡේද සංකල්පය

(ලකුණු 03)

II. මූල්‍ය වාර්තාකරණය සඳහා වූ IASB සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) හා සෘජුවම සම්බන්ධ වන මූලිකාංග **තුන** නිර්වචනය කරන්න.

(ලකුණු 03)

III. මූල්‍ය වාර්තාකරණය සඳහා වූ IASB සංකල්පනාත්මක රාමුවට අනුව පහත සඳහන් අවස්ථාවන්හිදී අදාල වන ගුණාත්මක ලක්ෂණය නම් කරන්න.
- i. ගිණුම් කාලච්ඡේදයෙන්, කාලච්ඡේදයට එකම ගිණුම් ප්‍රතිපත්ති භාවිත කිරීම.
- ii. වත්කම් ඒවායේ වෙළඳපල අගය නිරූපනය කරන පරිදි ප්‍රත්‍යාගණනය කිරීම.
- iii. වර්තමාන මූල්‍ය තොරතුරු මත පදනම්ව තීරණ ගැනීම.

(ලකුණු 03)

IV. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ රෙගුලාසිමය රාමුවේ ප්‍රධාන අංග සඳහන් කරන්න.

(ලකුණු 03)

V. තොග සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ''තොග'' යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 02)

VI. දේපළ, පිරියත සහ උපකරණ සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ''දේපළ, පිරියත සහ උපකරණ'' යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 02)

VII. 'මූල්‍ය වාර්තා සකස් කරන කාලයට පසු සිදුවීම්' වලට අදාල ප්‍රමිතයෙහි සඳහන් පරිදි එම සිදුවීම්වල ප්‍රධාන වර්ග දෙක නම් කර, ඒ එකිනෙකට උදාහරණය බැගින් දක්වන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

දිනෙත්ගේ ව්‍යාපාරයේ 2014 අප්‍රේල් මස සිදු වූ ගණුදෙනු සහ එම මාසයට අදාල තොරතුරු පහත දැක්වේ.

I.

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2014.04.02 | අත්පිට විකුණුම් රු.100,000. |
| 2014.04.12 | සාමාගෙන් රු.110,000 ක ලකුණු කළ මිලකට භාණ්ඩ මිල දී ගත් අතර මෙයින් 10% ක් වෙළඳ වට්ටමක් ලෙස ලබා දෙන ලදී. |
| 2014.04.13 | රු.410,000 ක් වටිනා භාණ්ඩ නයනාට ණයට විකුණූ අතර රු.10,000 ක වෙළඳ වට්ටමක් ලබා දෙන ලදී. |
| 2014.04.14 | රු.260,000 කට AB සමාගමෙන් ලී බඩු ණයට මිල දී ගන්නා ලදී. |
| 2014.04.15 | නැවත විකිණීම සඳහා සඳමාලිගෙන් රු.92,000 ක භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. |
| 2014.04.17 | රු.300,000 ක භාණ්ඩ අතුලට ණයට විකුණන ලදී. |
| 2014.04.22 | සාමාට ගෙවිය යුතු මුදල් 5% ක මුදල් වට්ටමකට යටත්ව පියවා දමන ලදී. |
| 2014.04.24 | නයනාගෙන් ලැබිය යුතු මුළු මුදල රු.8,000 ක මුදල් වට්ටමකට යටත්ව පියවන ලදී. |
| 2014.04.28 | මාසික ගෙවල් කුලිය වූ රු.20,000 ගෙවන ලදී. |
| 2014.04.29 | රංග නමැති ණයගැතියා එවූ රු.60,000 ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කරන ලදී. |

II. ව්‍යාපාරය සියළුම ගණුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් කරනුලබන අතර 2014 අප්‍රේල් මස 01 දින එහි ශේෂය රු.40,000 ක් විය.

III. 2014.05.01 දින බැංකුවෙන් ලද ගිණුම් ප්‍රකාශයට අනුව 2014 අප්‍රේල් මාසය සඳහා බැංකු ගාස්තු රු.1,000 ක් අය කර ගෙන ඇත.

IV. මාසික ගෙවල් කුලී සඳහා නිකුත් කළ චෙක්පත ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර රංගගෙන් ලද චෙක්පත ද උපලබ්ධි වී නොමැත.

අවශ්‍ය වන්නේ:

i. ඉහත I හි සඳහන් ගණුදෙනු අදාල මුලික සටහන් පොත්වල සටහන් කිරීම.

(ලකුණු 10)

ii. ඉහත සියළුම තොරතුරු ලෙජරයේ අදාල ගිණුම්වලට පිටපත් කර එම ගිණුම් ශේෂ කිරීම.

(ලකුණු 06)

iii. 2014 අප්‍රේල් මාසය සඳහා බැංකු සැසදුම් ප්‍රකාශය පිළියෙල කිරීම.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්න අංක 03

සීමිත තාරා සමාගමේ පොත්වලින් 2014.03.31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත සඳහන් පරිදි වේ.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| විකුණුම් | | 10,000 |
| ගැනුම් | 2,000 | |
| 2013.04.01 දිනට තොගය | 200 | |
| බෙදා හැරීමේ පිරිවැය | 1,300 | |
| පරිපාලන වියදම් | 800 | |
| අනෙකුත් වියදම් | 100 | |
| ආදායම් බදු ගෙවීම් | 260 | |
| ආදායම් බදු වෙන් කිරීම් - 2012/2013 | | 40 |
| මුදල් හා මුදල් සමාන දෑ | 20 | |
| මෝටර් රථ විකුණුම් ගිණුම | | 1,200 |
| ලාභාංශ ගෙවීම් | 180 | |
| වෙළඳ ණයගැතියෝ/වෙළඳ ණයහිමියෝ | 410 | 300 |
| අඩමාණ ණය වෙන් කිරීම් (2013.04.01 දිනට) | | 12 |
| ඉඩම් | 2,400 | |
| මෝටර් රථ | 8,800 | |
| මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් (2013.04.01 දිනට) | | 3,200 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (2013.04.01 දිනට) | | 1,500 |
| රඳවා ගත් ඉපයුම් (2013.04.01 දිනට) | | 218 |
| | 16,470 | 16,470 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

I. 2014.03.31 දිනට පැවති තොගයේ පිරිවැය රු.320,000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු.300,000 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත.

II. 2010.10.01 දින රු.2,800,000 කට මිලට ගත් මෝටර් රථයක් 2013.04.01 දින රු.1,200,000කට විකුණා ඇත. විකිණීමෙන් ලත් මුදල් මෝටර් රථ විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිවක් ලෙජරයේ සටහන් කර නැත.

III. වසර අවසාන වෙළඳ ණයගැතියන්ගෙන් රු.10,000 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතු අතර, අඩමාණ ණය වෙන් කිරීම අවසාන වෙළඳ ණයගැතියන්ගෙන් 5% ක් විය යුතුය.

IV. රු.400,000 ක් වටිනා ඉඩම් කොටසක් 2013.10.01 දින රජයට පරිත්‍යාග කර ඇති නමුත් මෙය ගිණුම්වල වාර්තා කර නැත.

V. මෝටර් රථ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

VI. 2014.03.31 දිනට පහත සඳහන් වියදම් ගෙවිය යුතුය.

- කාර්යාල ගොඩනැගිලි කුලිය රු.240,000
- විගණක ගාස්තු රු.60,000
- අධ්‍යක්ෂ වැටුප් රු.80,000

VII. ගෙවූ ආදායම් බදු වලින් රු.50,000 ක් 2012/2013 වසර සඳහා වේ. 2013/2014 වසරේ අවසාන කාර්තුවේ ආදායම් බදු වගකීම රු.90,000 ක් වේ යයි ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍ය වන්නේ:

ප්‍රසිද්ධ කිරීම සඳහා,

i. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය, සටහන් ද ඇතුළත්ව.

(ලකුණු 09)

ii. 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය), සටහන් සහ අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත්ව.

(ලකුණු 08)

iii. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

## II කොටස

**ප්‍රශ්න අංක 04**

I. i. මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ සහ පිරිවැය ගිණුම්කරණය යන පද පැහැදිලිව නිර්වචනය කරන්න.

ii. මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ ගිණුම්කරණයෙන් වෙනස්වන ආකාර **තුනක්** නිශ්චිතව සඳහන් කරන්න.

(ලකුණු 06)

II. පහත ප්‍රකාශ විවේචනාත්මකව පහදන්න.

i. සියළුම සෘජු පිරිවැය විචල්‍යය පිරිවැය වේ.

ii. ගිළුනු පිරිවැය තීරණ ගැනීම සඳහා අදාල නොවේ.

iii. විචල්‍යය පිරිවැය පාලනය කළ හැකි අතර ස්ථාවර පිරිවැය පාලනය කළ නොහැකි වේ.

(ලකුණු 06)

III. නිෂ්පාදන ආයතනයක් PQ නමැති අමුද්‍රව්‍ය වර්ගය ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදා ගනී. PQ අමුද්‍රව්‍ය සඳහා වන මාසික ඉල්ලුම ඒකක 6000 ක් වේ යයි ඇස්තමේන්තු කර ඇත. PQ අමුද්‍රව්‍ය සඳහා එක් ඇණවුමක් කිරීමේ පිරිවැය රු.3,200 ක් වේ. PQ අමුද්‍රව්‍ය ඒකකයක් රඳවා ගැනීමේ වාර්ෂික පිරිවැය රු.5.00 ක් වේ.

PQ අමුද්‍රව්‍ය සඳහා වන දිනක උපරිම භාවිතය ඒකක 50 ක් වන අතර සාමාන්‍ය භාවිතය ඒකක 40 කි. ඇණවුමක උපරිම පොරොත්තු කාලය දින 30 ක් වන අතර සාමාන්‍ය කාලය දින 25 කි.

**අවශ්‍ය වන්නේ:**

i. ආර්ථික ඇණවුම් ප්‍රමාණය

ii. යළි ඇණවුම් මට්ටම

iii. උපරිම තොග මට්ටම

iv. අවම තොග මට්ටම

v. සාමාන්‍ය තොග මට්ටම

(ලකුණු 05)

IV. ශ්‍රම පිරිවැටුම ආශ්‍රිතව සමාගමකට අදාලවන පිරිවැය වර්ග **තුනක්** නම් කරන්න.

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

I. කාර්ය පදනම් පිරිවැයකරණ ක්‍රමය (Activity Based Costing) සම්ප්‍රදායික පොදු කාර්ය පිරිවැය අවශෝෂණ ක්‍රමය සමග සංසන්දනය කර වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

II. XYZ සමාගම නිපදවන X, Y සහ Z නමැති භාණ්ඩ තුන සම්බන්ධයෙන් දෙන ලද කාලපරිච්ඡේදයකට අදාල තොරතුරු පහත දැක්වේ.

| | X | Y | Z |
|---|---|---|---|
| නිමැවුම් ඒකක ගණන | 10,000 | 20,000 | 30,000 |
| ඒකකයකට සෘජු ද්‍රව්‍ය (රු.) | 50 | 40 | 30 |
| ඒකකයකට සෘජු ශ්‍රමය (රු.) | 30 | 40 | 50 |
| ගැනුම් අධියාචනා සංඛ්‍යාව | 1200 | 1800 | 2000 |
| සැකසුම් සංඛ්‍යාව (Set-ups) | 240 | 260 | 300 |

මෙම කාලච්ඡේදයට අදාල නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු.2,600,000 ක් වන අතර එය ලැබීම් සහ පරීක්ෂණ (receiving and inspecting) පොදුකාර්ය පිරිවැය රු.1,400,000 කින් සහ නිෂ්පාදන පෙළගැසීම් සහ යන්ත්‍ර සැකසීම් (production scheduling and machine set-ups) පොදුකාර්ය පිරිවැය රු.1,200,000 න්ද සමන්විත වේ.

අවශ්‍ය වන්නේ:

කාර්ය පදනම් පිරිවැයකරණය භාවිතා කර නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය.

(ලකුණු 04)

III. ගණුදෙනුකරුවන්ගේ සුවිශේෂී ඇණවුම් සැපිරීමට ආයතනයක් කාර්ය පිරිවැයකරණය භාවිතා කරයි. කාලච්ඡේදයට අදාල තොරතුරු පහත දැක්වේ.

| | A කාර්ය<br>රු. | B කාර්ය<br>රු. | C කාර්ය<br>රු. |
|---|---|---|---|
| ආරම්භක නොනිමි තොගය | 31,400 | 50,700 | - |
| එකතු කරන ලද ද්‍රව්‍ය | 16,200 | - | 19,750 |
| ශ්‍රමය | 15,000 | 5,500 | 27,250 |

කාලච්ඡේදය සඳහා අයවැයගත පොදුකාර්ය පිරිවැය රු.137,500 ක් වේ.

**අවශ්‍ය වන්නේ,**

i. C කාර්ය සඳහා අය කළයුතු පොදුකාර්ය පිරිවැය.

ii. B කාර්ය, කාලච්ඡේදය තුළ දී නිම කරන ලද අතර, විකුණුම් මත 50% ක ලාභයක් ඉපයීමට අපේක්ෂා කරයි නම් එහි විකුණුම් මිල.

iii. අවසාන නොනිමි තොගයේ පිරිවැය.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

I. පිරිවැය පරිමා ධාරිතා විශ්ලේෂණයේ සීමාවන් **හතරක්** දක්වන්න.

(ලකුණු 04)

II. සීමිත කසුන් සමාගම එක් භාණ්ඩයක් නිපදවන නිෂ්පාදකයෙක් වේ. පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

පසුගිය වසර දෙකකට අදාල විකුණුම් සහ ලාභ පහත පරිදි වේ.

| වසර | විකුණුම් (රු.) | ලාභ (රු.) |
|---|---|---|
| 2012 | 150,000 | 20,000 |
| 2013 | 170,000 | 25,000 |

**අවශ්‍ය වන්නේ:**

i. ලාභ පරිමා අනුපාතය.

ii. ආයතනයේ ස්ථාවර පිරිවැය.

iii. සමච්ජේද ලක්ෂය.

iv. රු.40,000 ක ලාභයක් ඉපයීමට අවශ්‍ය විකුණුම් වටිනාකම.

v. රු.250,000 ක ලාභයකදී ආරක්ෂිත ආන්තිකය

vi. රු.100,000 විකුණුම් වටිනාකමකදී මුළු ලාභය

(ලකුණු 06)

III. සීමිත හරිස් සමාගම විකුණුම් මිල රු.16 ක් සහ විචල්‍යය පිරිවැය රු.9 ක් වන විශේෂිත කඩදාසි පිඟන් වර්ගයක් අවන්හලක් සඳහා නිෂ්පාදනය කරයි. වාර්ෂික ස්ථාවර පිරිවැය රු.32,000 ක් වන අතර අයවැය ගත විකුණුම් ඒකක 9000 ක් වේ. සමාගම විසින් නව නිෂ්පාදන ක්‍රමයක් සමාලෝචනය කරමින් සිටී. මෙමඟින් ස්ථාවර පිරිවැය 30% කින් වැඩිවන නමුත් විචල්‍යය පිරිවැය පිඟානකට රු.1.50 කින් අඩු වේ. නව නිෂ්පාදන ක්‍රම මඟින් භාණ්ඩයේ තත්ත්වය ඉහළ දමන නිසා පිඟානක විකුණුම් මිල රු.18 දක්වා වැඩිකර ගත හැක. මෙම නව ක්‍රම ක්‍රියාත්මක කිරීමට සමාගම බලාපොරොත්තු වන්නේ නම් :

**අවශ්‍ය වන්නේ,**

i. වර්තමාන ලාභ මට්ටම ඉපයීමට අවශ්‍ය නිෂ්පාදන මට්ටම.

ii. නව නිෂ්පාදන ක්‍රම යටතේ ආරක්ෂිත ආන්තිකය අයවැයගත විකුණුම්වලට ප්‍රතිශතයක් ලෙස.

iii. රු.60,000 ක ඉලක්කගත ලාභයක් ලැබීමට අවශ්‍ය අයවැයගත විකුණුම් මට්ටම.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**************************